WORKED.


# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,549 — 1958 ඔක්තෝබර් 10 වැනි සිකුරාදා — 10.10.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV වැනි කොටස – පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 871 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 871 | මාර්ග කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 873 |


## පළාත් පාලන නිවේදන

ඇල්.ජී.සී.—නො. ජීසී. 48/66

### 1946යේ අංක 12 දරණ විනෝද බද්ද පිළිබඳ ආඥාපනත

1946 යේ අංක 12 දරණ විනෝද බද්ද පිළිබඳ ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ උළගල්ල කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්මත කර ගන්නාලද පහත දැක්වෙන යෝජනාව පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අනුමත කර තිබේ. එකී වගන්තියේ (2) වැනි උප වගන්තියේ ප්‍රකාර එය මෙයි පළ කරනු ලැබේ.

#### යෝජනාව

1946 යේ අංක 12 දරණ විනෝද බද්ද පිළිබඳ ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙම කාර්‍ය සභාව විසින් මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට මෙම කාර්‍ය සභාවේ පාලන බල සීමාව ඇතුළත පැවැත්වෙන (ආඥාපනතේ විස්තර කර තිබෙන) විනෝද සඳහා ප්‍රවේශවීම පිණිස අයකරනු ලබන ගෙවීම් වලින් මෙහි පහත දැක්වෙන රේට් ගණන් අනුව බද්දක් පණවා අයකරනු ලැබේ :—

| ගෙවන මුදල | බද්දේ රේට් ගණන රු. ශ. |
|---|---|
| බද්ද හැර ඇතුළත්වීමේ ගාස්තුව— | |
| (අ) ශත 20 කට අඩු නොවන්නාවූ එහෙත් ශත 50 කට වැඩි නොවන්නාවූ විට ... ... | 0.05 |
| (ආ) ශත 50 කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 1 කට වැඩි නොවන්නාවූ විට ... ... ... | 0.10 |
| (ඇ) රුපියල් 1 කට වැඩි වන්නාවූ එහෙත් රු. 1.50 කට වැඩි නොවන්නාවූ විට ... ... ... | 0.15 |
| (ඈ) රුපියල් 1.50 කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 2 කට වැඩි නොවන්නාවූ විට ... ... | 0.20 |
| (ඉ) රුපියල් 2 කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 3 කට වැඩි නොවන්නාවූ විට ... ... | 0.30 |
| (ඊ) රුපියල් 3 කට වැඩි වන්නාවූ එහෙත් රු. 4 කට වැඩි නොවන්නාවූ විට ... ... ... | 0.40 |
| (උ) රුපියල් 4 කට වැඩි වන්නාවූ එහෙත් රු. 5 කට වැඩි නොවන්නාවූ විට ... ... ... | 0.50 |
| (ඌ) රුපියල් 5 කට වැඩි වන්නාවූ එහෙත් රු. 10 කට වැඩි නොවන්නාවූ විට ... ... | 1.00 |
| (එ) රුපියල් 10 කට වැඩිවූ විට— | |
| (1) පළමු වැනි රුපියල් 10 ... ... | 1.00 |
| (2) ඊට වැඩිවූ එක් එක් රුපියල් 5 ට හෝ ඉන් කොටසකට ... ... ... | 1.00 |

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ සථාවර ලේකම්තැන.

1958 සැප්තැම්බර් 25 දින,
කොළඹදීය.

## අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී—බී 177/40—ඇල්ජී/ඩී—ජීජේ 9/2 ඒ.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ මීගම-ඉත්තපාන-වැලිපැන්න ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947ක්වූ සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියේ (3) වෙනි උප

වගන්තියෙන් පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කායර්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1958 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

කළුතර දිස්ත්‍රික්කයේ ඇතැම් ගම්කායර්‍ය සභාවන් විසින් සම්පාදිතව, 1940ක්වූ නොවැම්බර් මස 22 වැනි දින අංක 8,684 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා, මීගමු-ඉත්තපාන-වැලිපැන්න ගම් ප්‍රදේශ සම්බන්ධයෙන් පමණක් අදාළ වන පරිද්දෙන් ඊට යාකොට ඇති උපලේඛනය අස්කොට ඒ වෙනුවට පහත සඳහන් අළුත් උපලේඛනය යෙදීමෙන් මෙසින් සංශෝධනය කරනු ලැබේ :—

### උපලේඛනය

| | |
|---|---|
| " කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ කරත්තයක් හැර වෙන ඕනෑම අන් දමක වාහනයක් සඳහා ... | ... මී. ඉ. වැ. වා. |
| සෑම ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | ... මී. ඉ. වැ. ක. |
| සෑම තනි ගොනා බඳින බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... | ... මී. ඉ. වැ. බා. |
| සෑම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා | ... මී. ඉ. වැ. රි. |
| සෑම අන් කරත්තයක් සඳහා ... | ... මී. ඉ. වැ. අ. |
| සෑම බයිසිකලයක් සඳහා ... | ... මී. ඉ. වැ. බ. " |

---

ඇල්.ජී.සී—ජීසී. 14/40/7.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ හලාවත දිස්ත්‍රික්කයේ මැද පලාත ගම් ප්‍රදේශයේ ගම්කායර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පලාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කායර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 සැප්තැම්බර් මස 25 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

#### අප්‍රසන්න වූ හා අන්තරායදායක වූ කර්මාන්ත

1. පහත දැක්වෙන කර්මාන්ත අන්තරාදායකවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) කබුක්ගල්, බොරළු හෝ කළුගල් ලබාගැනීමට ගල්වලවල් කැපීම.
(2) හුණුගල් ලබාගැනීම පිණිස වලක් කැපීම.
(3) යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් පොල් තෙල් සිඳීම,
(4) කපාපු පොල් වියලා සකස් කිරීම.
(5) කෙඳි වගී තෙලීම හෝ ගබඩා කිරීම.
(6) හාල්මෝලක් තබාගැනීම,
(7) කොප්පරා ගබඩා කිරීම.
(8) කොප්පරා සෑදීම.
(9) පිදුරු ගබඩා කිරීම.
(10) සෙක්කුවකින් පොල් තෙල් සිඳීම.
(11) භූමිතෙල් ගබඩාවක් තබාගැනීම.
(12) ස්වර්ණාභරණ සාදන ස්ථානයක් තබාගැනීම.
(13) කම්මලක් තබාගැනීම.
(14) මුද්‍රණාලයක් තබාගැනීම.
(15) මෝටර් රථ අළුත්වැඩියා කිරීම සඳහාවූ ස්ථානයක් තබා ගැනීම.
(16) බයිසිකල් අළුත්වැඩියා කිරීම සඳහාවූ ස්ථානයක් තබාගැනීම.
(17) ලීඉරන මෝලක් තබාගැනීම.
(18) ගෘහ භාණ්ඩ සෑදීම.
(19) ගිනිකූරු සෑදීම.

2. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) ජාඩි හෝ කරවල ගබඩාකිරීම.
(2) විනාකිරි සෑදීම.
(3) සබන් සෑදීම.
(4) මාළු අයිස් දැමීම.
(5) සුරුට්ටු, සිගරට් හෝ බීඩි සෑදීම.
(6) තොග ගණනේ විකිණීම සඳහා නරක්විය හැකි ආහාර හා ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.
(7) කොම්පෝස්ට් පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීම.
(8) හම් පදම්කරන ස්ථානයක් තබාගැනීම.
(9) පුවක් වියලීම.
(10) සතුන්ගේ ලේ හෝ මළකුණු උණුකිරීම.
(11) සතුන්ගේ හම් ගබඩාකිරීම.
(12) සතුන්ගේ ඇටකටු ගබඩාකිරීම.
(13) කෝඩා සෑදීම.
(14) දුම්කොළ වියලීම.
(15) පැණි හකුරු සෑදීම.
(16) රා එකතුකිරීමේ ස්ථානයක් තබාගැනීම.
(17) මිරිස් සහ වෙනත් කුනපහ වගී යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් ඇඹරීම.

3. පහත දැක්වෙන කර්මාන්ත අන්තරාදායකවූ හා අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) බැටරි චාජ්කිරීම.
(2) අඟුරු ලබාගැනීම සඳහා පොල්කටු පිච්චීම.

---

ඇල්. ඞී.—ඞී 54/49

ඇල්. ජී. ඞී.—ජීජ් 11/39/4.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ, බදුළු දිස්ත්‍රික්කයේ බුත්තල වැදිරට ගම් ප්‍රදේශයේ ගම් කායර්‍ය සභාව විසින් සම්පාදිතව, වර්ෂ 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1958ක්වූ සැප්තැම්බර් මස 25 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

1957තේ මාර්තු මස 8 වැනි දින අංක 11,087 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ අප්‍රසන්න හා අන්තරාදායක කර්මාන්ත සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා, එහි (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදයේ "(කේ) රබර් කර්මාන්ත ශාලාවක් තබා ගැනීම" යන කාරණය එක්කම ඊළඟට පහත සඳහන් අලුත් කාරණා යෙදීමෙන් මෙසින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඇල්) බයිසිකල් අලුත්වැඩියා කිරීම සඳහාවූ වැඩපොළක් තබා ගැනීම.
(ඇම්) මෝටර් රථ අලුත් වැඩියා කිරීම සඳහාවූ වැඩපොළක් තබා ගැනීම.
(ඇන්) ගෘහ භාණ්ඩ සෑදීම.
(ඕ) ලී ඉරන මෝලක් තබා ගැනීම."

---

ඇල්. ඞී.—ඞී 73/48

ඇල්. ජී. ඞී.—ජීජ් 11/59/1.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ගම් ප්‍රදේශයේ ගම් කායර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළ වූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කායර්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1958 සැප්තැම්බර් මස 25 වැනි දින,
කොළඹදීය.

අනුරු චාවකථා

1. කිසියම් ගම්බද වෙළඳ පොළක සිට සැතපුම් එකක අර්ධ විෂ්කම්භයක කවයක් ඇතුළත වූ ප්‍රදේශය, එකී වෙළඳ පොළ සඳහා වූ වෙළඳ ප්‍රදේශය වශයෙන් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

2. කිසියම් ගම්බද වෙළඳ පොළක යම් ස්ථානයක් පාවිච්චි කිරීම හෝ එහි නැවතී සිටීම සඳහා පහත දැක්වෙන රේට් ගණන් අනුව ගාස්තුවක් අය කළ යුතුය, නැතහොත් ගෙවිය යුතුය :—

| | දිනකට ශත ගණන |
|---|---|
| (1) එළවළු වෙළඳාම් පොළේ හතරැස් අඩි 12කට වැඩි නොවන ආවරනය නොකරන ලද ස්ථානයක් සඳහා ... ... ... | 0 10 |
| (2) හතරැස් අඩි 12කට වැඩි නොවන ආවරනය කරන ලද ස්ථානයක් සඳහා ... ... | 0 20 |
| (3) මාළු වෙළඳාම් පොළේ හතරැස් අඩි 12කට වැඩි නොවන ආවරනය නොකරන ලද ස්ථානයක් සඳහා ... ... ... | 0 20 |
| (4 හතරැස් අඩි 12කට වැඩි නොවන ආවරනය කරන ලද ස්ථානයක් සඳහා ... ... | 0 40 |

# විවිධ දැන්වීම්

## අම්බලන්ගොඩ නගර සභාව

1939 නොම්මර 61 දරණ නගර සභා ආඥාපනතේ 173 (3) වෙනි වගන්තිය යටතේ නගර සභා සීමාව තුළ පිහිටි නිශ්චල දේපල වල වාර්ෂික තක්සේරුවෙන් 1959 වර්ෂයට සියයට එකොළහක බද්දක් පසුගිය වර්ෂයේ මෙන්ම අයකිරීම පනවා තිබෙන බවද, එම බද්ද පිළිවෙලින් ජූනි 30 සහ දෙසැම්බර් 31 දිනවල වාර දෙකකින් ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

සෑම් රණසූරිය,
අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති.

1958 ඔක්තෝබර් මස 1 වෙනි දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ දීය.

---

## අම්බලන්ගොඩ නගර සභාව

### රථ වාහන සහ සතුන් පිළිබඳ බද්ද

1939 නොම්මර 61 දරණ නගර සභා ආඥාපනතේ 175 වෙනි වගන්තිය යටතේ පහත සඳහන් උප ලේඛනයෙහි නම් කරන ලද රථ වාහන සහ සතුන්ට ඒ ලේඛනයෙහි එම වාහන සතුන් කෙලින් සඳහන් කර තිබෙන ගාස්තු පසුගිය වර්ෂයට මෙන්ම 1959 වර්ෂයටද පනවා ඇති බවත්.

2. යථෝක්ත ආඥාපනතේ 176 (3) වෙනි වගන්තිය යටතේ එකී බදු 1959 මාර්තු මස 31 වෙනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් අම්බලන්ගොඩ නගර සභාව දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, ට්‍රයිසිකල්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර ඕනෑම රථයකට ... | 5.00 |
| ඕනෑම බයිසිකලයකට හෝ රෝද තුනේ බයිසිකලයකට :— | |
| (ඒ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම් ... | 3.00 |
| (බී) වෙළඳ කාර්යයන් හැර වෙන ඕනෑම කටයුත්තකට පාවිච්චි කරන්නේ නම් ... ... | 1.00 |
| (සී) ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බර කරත්තයකට හෝ තිරික්කලයකට ... | 4.00 |
| (ඩී) ඕනෑම අන්දමක හෝ තනි ගොනා බඳින කරත්තයකට හෝ තිරික්කලයකට ... ... | 2.50 |
| (ඊ) ඕනෑම අත් කරත්තයකට ... ... | 2.00 |
| (ඈෆ්) ජින් රික්ෂෝ රථයකට ... ... | 2.50 |
| (ජී) ඕනෑම අශ්වයෙකුට හෝ අශ්ව පෝනියෙකුට හෝ බූරුවෙකුට ... ... ... | 2.50 |

සෑම් රණසූරිය
අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති.

1958 ඔක්තෝබර් මස 1 වෙනි දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ දීය.

---

## අම්බලන්ගොඩ නගර සභාව

### 1959 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු, සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත 334 වෙනි පරිච්ඡේදය

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 334 වෙනි පරිච්ඡේදයේ 4 වෙනි කොටසේ ප්‍රකාර අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලෙකුට හා බැල්ලියකට 1958 වර්ෂයේ අය කරන ලද ගාස්තුව වන රුපියල් එකයි, ශත පණහ 1959 වර්ෂයටද අය කිරීමට පනවා ඇති බවද එකී ගාස්තු 1959 අප්‍රේල් මස 1 වෙනි දින හෝ ඊට පෙර හෝ ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

සෑම් රණසූරිය,
අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති.

1958 ඔක්තෝබර් මස 1 වෙනි දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ දීය.

---

## නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩපළාත ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත් මෙහි බල පත්‍ර නිකුත් කිරීමට විරුද්ධව නුවර එළිය දිස්ත්‍රික්කයේ උඩපළාත ගම්කාර්ය සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 තේ අංක. 44 දරණ ආඥාපණතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපණතේ යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| අංකය | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|---|
| (1) | ඇස්. ඇම්. ෂෙරීප් සමාගම, රාගල කඩවීදිය, හල්ගරන් ඔය. | සහ රාගල කඩවීදියේ හරක් මස් විකිණීම. |
| (2) | ඇස්. ඇම්. ෂෙරීප් සමාගම, රාගල කඩවීදිය, හල්ගරන් ඔය. | සහ රාගල කඩවීදියේ එළු මස් විකිණීම. |
| (3) | ඇම්. අබ්දුල් රහීම්, සෝල්ව කන්ද කඩවීදිය, හැල්ලාව. | සෝල්වකන්ද කඩවීදියේ හරක් උඩපුස් මස් විකිණීම. |

කේ. එච්. පද්මසිරි,
උඩපලාත ගම්කාර්ය සභාවේ සභාපති තැන.

1958 ක්වූ ඔක්තෝබර් මස 7 වැනි දින,
රාගල, හල්ගරන් ඔය පිහිටි උඩපලාත
ගම්කාර්ය සභා කාර්යාලයේ දීය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.